# ආර්.එච්. ඒකනායක එ. උතුරුමැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 1028 /2019 (2019.06.04 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ  කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ  එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණි වල්ගම

**අභියාචක** - ආර්.එච්. ඒකනායක
**නොතිසි ලත් පාර්ශවය** - ප්‍රධාන ලේකම්, උතුරුමැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

**පෙනීසිටීම**
අභියාචක - ආර්.එම්. නවරත්නබණ්ඩා
පොදු අධිකාරිය - පැමිණ නොසිටින ලදි.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.12.12 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.12.15 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.12.19 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.12.24 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.12.28 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.12.12 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත දැක්වෙන තොරතුරු ඉල්ලා සිටින ලදි.

1. අභියාචක උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කළ කාලය පිළිබඳව අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ බව සඳහන් 2016/09/20 දිනැතිව වාර්තාවේ සහතික කළ ඡායා පිටපතක්.
2. ඉහත අංක 1 හි සඳහන් අභ්‍යන්තර විගණන වාර්තා පදනම් කරගෙන ගණකාධිකාරී රත්නායක මහතා විසින් අභියාචක සම්බන්ධයෙන් සිදු කරන ලද බව සඳහන් මූලික විමර්ශන වාර්තාවේ හා ඊට අදාළ ඇමුණුම් වල සහතික කළ ඡායා පිටපතක්.
3. ඉහත අංක දෙකෙහි සඳහන් මූලික විමර්ශන වාර්තාවේ කරුණු සම්බන්ධයෙන් පලාත් වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NCP/LRDW/E3 හා 2018/08/08 දිනැතිව ඉදිරිපත් කළ බව සඳහන් නිරීක්ෂණ වාර්තාවේ සහතික කළ පිටපතක්.
4. උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් තුමා විසින් අභියාචක උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කළ කාලය එම අධිකාරිය වෙත මුදාහරින කාලයක් සේ සලකා කටයුතු කිරීමට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා යවන ලද ලිපියේ සහතික කරන ලද ඡායා පිටපතක්.
5. ඉහත අංක හතරේ සඳහන් ලිපියට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක NCP/PSC/9/5/10 හා 2018/11/15 දිනැතිව ඔබ වෙත එවන ලද ලිපියේ සහතික කළ ඡායා පිටපතක්.

2018.12.15 දිනැතිව තොරතුරු නිලධාරියා විසින් දන්වා සිටින ලද්දේ අභියාචක විසින් අයදුම් කර ඇති තොරතුරු අතුරින් අංක 4 ට අදාළ අදාල ලිපියේ සහතික කළ ඡායා පිටපතක් මේ සමග ඉදිරිපත් කර ඇත. අභියාචක විසින් ඉල්ලා ඇති අනෙකුත් තොරතුරු පහත සඳහන් හේතුන් මත ප්‍රතික්ෂේප කරන ලද බව කාරුණිකව දන්වමි.

| අයිතම අංකය | ප්‍රතික්ෂේප කිරීමට හේතුව |
|---|---|
| 01 | මෙම වාර්තාව අප අධිකාරියෙහි පාලනය හෝ භාරයෙහි නොමැත. උතුරුමැද පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ තොරතුරු නිලධාරී වෙතින් විමසන්නේ නම් මැනවි |
| 02 | මූලික විමර්ශන වාර්තා මෙම තොරතුරු ඒකකයෙහි රහස්‍ය ලේඛනයක් ලෙස වර්ගීකරණය කර ඇති බැවින් ලබාදිය නොහැක. |
| 03 | මෙම වාර්තාව අප අධිකාරියෙහි පාලනය හෝ භාරයේ නොමැත. උතුරු මැද පළාත් වාරිමාර්ග අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරී වෙතින් විමසන්නේ නම් මැනවි. |
| 05 | මෙම වාර්තාව අප අධිකාරියෙහි පාලනය හෝ භාරයේ නොමැත. උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තොරතුරු නිලධාරී වෙතින් විමසන්නේ නම් මැනවි. |

**මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.12.19 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකරන ලදි. 2018.12.24 දිනැතිව නම්කළ නිලධාරියා ප්‍රතිචාර දක්වමින් සඳහන් කර සිටින ලද්දේ අභියාචක** විසින් අයදුම් කර ඇති තොරතුරු වලට අදාළ මූලික විමර්ශන වාර්තා මෙම තොරතුරු ඒකකයෙහි රහස්‍ය ලේඛනයක් ලෙස වර්ගීකරණය කර ඇති බැවින් එම වාර්තා ලබාදිය නොහැකි බව කාරුණිකව දන්වමි. **මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2018.12.28 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමුකරන ලදි.**

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා පොදු අධිකාරිය පැමිණ නොමැති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටී.

ඒ අනුව පොදු අධිකාරිය නොපැමිණීම සම්බන්ධව පොදු අධිකාරියේ තොරතුරු නිලධාරී ප්‍රසාදි විජේසිංහගෙන් දුරකතනයෙන් විමසීමේදී ඇය සඳහන් කර සිටියේ අදාළ අභියාචනා විභාගය පිළිබඳ ලිපිය ඇය වෙත නොලැබුණු බැවින් අභියාචනය සඳහා සහභාගීවීමට නොහැකි වූ බවයි.

අභියාචනා විභාගයේදී අභියාචක විසින් කරුණු දක්වා සිටියේ තමන් විසින් මූලික විමර්ශන වාර්තාවේ ලේඛන 5ක් ඉල්ලා සිටි අතර ඉන් අයිතම 1 හා 4ට අදාළ ලේඛන පමණක් ලබා දී ඇති බවයි.

අයිතම 2ට අදාළ තොරතුරු රහසිගත වාර්තාවන් වන බවට පොදු අධිකාරිය දක්වා ඇති බව අභියාචක කියා සිටී.

එසේම අභියාචක සඳහන් කර සිටින්නේ අයිතම 3ට අදාළව එම ලේඛනය පොදු අධිකාරියේ මගපෙන්වීම යටතේ අමාත්‍යාංශ ලේකම්ගෙන් ලබාගැනීමට කටයුතු කරන ලෙස දැන්වූවද ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්ගෙන් විමසීමේදී එය ප්‍රධාන ලේකම්වරයාගෙන් ලබාගැනීමට මෙහෙයවූ බවය. එහෙත් ප්‍රධාන ලේකම්වරයා අදාළ වාර්තාව ලබා දී නොමැති අතර එම වාර්තාව ඔහු සතුව ඇති බව වෙනත් ලේඛනවලින් පැහැදිලි වන බවය.

එසේම අයිතම 5ට අදාළව එම ලිපියේ සහතික කළ පිටපතක්ද අභියාචක වෙත ලබා දී නොමැති බවද සඳහන් කර සිටී.

ඒ අනුව මූලික විමර්ශන වාර්තාවන් රහස්‍ය ලේඛනයක් ලෙස දක්වා එය ලබාදීම ප්‍රතික්ෂේප කිරීම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට පටහැනි බව කොමිෂන් සභාව අවධාරණය කර සිටින අතර කොමිෂන් සභාව හමුවේ තීරණය වූ මේ හා සමාන අභියාචනාවලදී එනම් RTIC/Appeal/49/2018 - අයි.ආර්. චිත්‍රානන්ද කුමාර එ. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, RTIC/Appeal/160/2018 - ජනිදු සී.ඩී. සෙනෙවිරත්න එ. ශ්‍රී ලංකා පොලිස් කොමිසම හා RTIC/Appeal/142/2018 - තිලක් රංජිත් සිල්වා එ. ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය යනාදී ආභියාචනාවලදී එකී විමර්ශන වාර්තාවන් ලබාදීමට කොමිෂන් සභාව විසින් නියෝග නිකුත් කර ඇති බවද කොමිෂන් සභාව අවධාරණය කර සිටී. ඒ අනුව අභියාචක විසින් අයදුම්කර ඇති තොරතුරු රහසිගත තොරතුරු නොවන බවට කොමිෂන් සභාව අවධාරණය කර සිටී.

**නියෝගය:**

ඒ අනුව පොදු අධිකාරියේ නොපැමිණීම මත මීළඟ අභියාචනා විභාගය සඳහා පොදු අධිකාරියේ පැමිණීම අනිවාර්ය වන අතර පනතේ 39(1)(ඇ) වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටීමේදී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම පැහැර හරිනු ලැබීම වරදට වරදකරු විය හැකි බවටත් පොදු අධිකාරියට මින් දන්වා සිටිනු ලැබේ.

මීළඟ අභියාචනා විභාගය 2019.09.24 දින පෙ.ව. 11.00 ට කල්තබනු ලැබේ .

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****